"ඉගෙනුම ඉගැන්වීමේ ක්‍රියාවලිය සඳහා මධ්‍ය මහා විද්‍යාල හා මහා විද්‍යාලයන්හි පිහිටුවා ඇති පාසල් පුස්තකාලවලින් ලැබෙන දායකත්වය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්."
(අනුරාධපුර දිස්ත්‍රික්කය ඇසුරින්)

අශෝකා ශ්‍රියාණි සිරිවර්ධන.
ශිෂ්‍ය අංකය: LISC/M/11/C/97

කැලණිය විශ්වවිද්‍යාලයේ සාමාජීය විද්‍යා පීඨයේ පුස්තකාල හා විඥාපන විද්‍යාව පිළිබඳ සාමාජීය විද්‍යාපති පර්යේෂණ උපාධිය සඳහා ඉදිරිපත් කරන ලදී.

කැලණිය විශ්වවිද්‍යාලය.
1999 ජූනි 30

## නිබන්ධ සාරාංශය.


අපගේ වෘත්තීය සුදුසුකම් සපුරාලීම සඳහා හදාරණු ලැබූ පුස්තකාල හා විඥාපන විද්‍යා පාඨමාලාවෙහි පර්යේෂණ අංශය ආවරණය කිරීම සඳහා ඉදිරිපත් කෙරෙන නිබන්ධය වශයෙන් මෙය හැඳින්වීමට පුළුවන. ඒ අනුව "ඉගෙනුම ඉගැන්වීමේ ක්‍රියාවලිය සඳහා මධ්‍ය මහා විද්‍යාල හා මහා විද්‍යාලයන්හි පිහිටුවා ඇති පාසල් පුස්තකාලවලින් ලැබෙන දායකත්වය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්" (අනුරාධපුර දිස්ත්‍රික්කය ඇසුරින්) යන මාතෘකාව යටතේ මෙම පර්යේෂණය සිදු කරනු ලැබිණි. විශේෂයෙන් මෙම මාතෘකාව තෝරා ගැනීමට මා තුළ කැමැත්තක් ඇති වූයේ මා කුඩා කළ සිටම හැදුනු වැඩුනු ප්‍රදේශය පිළිබඳව කිසියම් පර්යේෂණයක් කිරීමේ ඇති උවමනාව නිසා වෙති. මෙම පර්යේෂණ කාර්යය තුළින් ප්‍රදේශයේ පාසල් පුස්තකාල පිළිබඳව ඉදිරිපත් කෙරෙන තොරතුරු අනාගතයේ පාසල් පුස්තකාල වල අභිවෘද්ධිය සඳහා හේතුවීම මෙයින් ඇති වන ප්‍රතිඵලයකි.

ලංකාවේ පාසල් පුස්තකාල පිළිබඳව පසුගිය කාල පරිච්ඡේදයේ දී උගතුන් විසින් පර්යේෂණයන් කර ඇතත් විශේෂයෙන් ඒ ඒ ප්‍රදේශ වෙන් කොට හඳුනාගෙන ඒවායේ පවත්නා ගැටලු අධ්‍යයනය කොට ඉදිරිපත් කොට නොමැත. අනුරාධපුරය වැනි දුෂ්කර දිස්ත්‍රික්කයක් තුළ පිහිටි පාසල් පුස්තකාල පිළිබඳව අධ්‍යයනය කිරීම කාලීන අවශ්‍යතාවයක් හා පර්යේෂණ අවකාශයක් පවත්නා අංශයක් බව පැහැදිලි විය. එබැවින් උක්ත මාතෘකාව පිළිබඳව ප්‍රධාන තේමා හතරක් යටතේ කරුණු එක් රැස් කොට ඉදිරිපත් කර ඇත.

මෙහි දී දත්ත රැස් කිරීමේ මාර්ග කිහිපයක් අනුගමනය කරමින් අදාළ කරුණු රැස් කරනු ලැබිණි. මෙම පර්යේෂණයේ මූලික අරමුණ වූයේ ඌණ සංවර්ධනයක් ඇති, එමෙන්ම විවිධ ආර්ථික දුෂ්කරතා වලින් සහ ත්‍රස්තවාදී උවදුරු වලින් පීඩිත ප්‍රදේශ වල පිහිටි පාසල් මෙන්ම නාගරික ප්‍රදේශ වල පිහිටි පාසල් පුස්තකාල පිළිබඳව ද අධ්‍යයනය කිරීමයි. මෙම දිස්ත්‍රික්කය තුළ විශාල පාසල් ප්‍රමාණයක් ඇතත් ඒ සියල්ල විමර්ශනය කොට පර්යේෂණය සඳහා දත්ත ලබා ගන්නේ නම් එය වඩා පුළුල් විෂය ක්ෂෙත්‍රයක් වන බැවින් තෝරා ගත් පාසල් කිහිපයක් පමණක් අපගේ අධීක්ෂණයට ලක් විය. මෙම

පාසල් පුස්තකාල පිළිබඳව දත්ත ලබා ගැනීම සඳහා විශේෂයෙන් පිළියෙල කරන ලද ප්‍රශ්නාවලියක්, ගුරු, ශිෂ්‍ය සහ කාර්ය මණ්ඩලයට ලබා දීම මඟින් තොරතුරු එක් රැස් කොට ගැනුණි. මෙසේ එක් රැස් කොට ගත් දත්ත විශ්ලේෂණය කිරීමේ දී පැහැදිලි වූයේ මෙම පාසල් වල ප්‍රමාණවත් භෞතික සම්පත්, මානව සම්පත්, මූල්‍ය සම්පත්, දැනුම අඩංගු මාධ්‍යය ආදියෙහි දැඩි ඌණ තාවයක් පවත්නා බවය. එසේම තිබෙන සම්පත් වුව ද නිසි කළමනාකරණයකින් උපරිම ප්‍රයෝජන ගැනීම සඳහා පාසල් මඟින් කටයුතු කර නොතිබිණි. සිසුන්ට පුස්තකාල භාවිතය සඳහා ප්‍රමාණවත් උනන්දු කිරීමක් ගුරුවරුන් හෝ පාසල් පුස්තකාල භාර නිලධාරීන් විසින් සිදුකර නොතිබිණි. ඒ අනුව ඉගෙනුම ඉගැන්වීමේ ක්‍රියාවලිය සඳහා අනුරාධපුර දිස්ත්‍රික්කයේ මධ්‍ය මහා විද්‍යාල සහ මහා විද්‍යාලයන්හි පිහිටුවා ඇති පාසල් පුස්තකාලවලින් ලැබෙන දායකත්වයේ පරස්පරතාවයක් පවතින බව මනාව පැහැදිලි වේ.

මෙහිලා විසඳුම් ලෙස සමස්ත අනුරාධපුර දිස්ත්‍රික්කය තුළ ම විශේෂයෙන් ම ග්‍රාමීය ප්‍රදේශවල පාසල් පුස්තකාලයන්හි වඩා සංවිධානාත්මක පුස්තකාල පද්ධතියක් ගොඩ නැංවිය යුතු බව පැහැදිලිව පෙනිණි. එසේම පුස්තකාල භාවිතය, පුස්තකාල සම්පත් හා නූතන තාක්ෂණය පිළිබඳව පාසල් පුස්තකාල පාඨක ප්‍රජාව, ගුරුවරු, විදුහල්පතිවරු, අධ්‍යාපනික ක්ෂේත්‍රයේ නිලධාරීන් දැනුවත් කිරීම සහ දැනුවත් වීම අවශ්‍ය වේ. පාසල් පුස්තකාලයාධිපතිවරු පුහුණු කිරීම, පුස්තකාල සම්පත් සංවර්ධනය සහ කළමනාකරණය, පුස්තකාල සම්පත් බෙදා හැරීම ආදිය පිළිබඳව වගකිය යුතු අංශවල අවධානය යොමුවීම ද අත්‍යවශ්‍ය කරුණකි.

සමස්තයක් වශයෙන් පාසල් පුස්තකාල සංවර්ධනය සඳහා, රාජ්‍ය අනුග්‍රහය ලබාදීමත්, එහි ලා ජාතික ප්‍රතිපත්තියකට අනුව ඉගෙනුම ඉගැන්වීමේ ක්‍රියාවලිය සංවිධානය විය යුතුය.